# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 මාර්තු මස 13 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.03.17 දින නිකුත් කරන ලදී)

# මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන)

**2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 159.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් (මේ පනතේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතේ විධිවිධාන අදාළ වීම පුළුල් කිරීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ මුදල් විශුද්ධිකරණය වරදේ විෂය පථය පුළුල් කිරීම සහ ඒ වරද සඳහා නිශ්චිතව දක්වා ඇති අවම සිරදඬුවම් කාලසීමාව ඉවත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින්, මුදල් විශුද්ධිකරණය වරද ඔප්පු කිරීම සඳහා නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු කිරීමේ අවශ්‍යතාව බැහැර කිරීමට ප්‍රධාන ප්‍රඥප්තියට 3අ වන අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලැබේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ මුදල් විශුද්ධිකරණය වරද හා සම්බන්ධ දේපළවලට අදාළ තොරතුරු හෙළිදරව් කිරීම පැහැරහැරීම සඳහා වන දඩ මුදල වැඩි කිරීම වේ.

***7 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ මුදල් විශුද්ධිකරණය වරද සම්බන්ධයෙන් වන විමර්ශනවලට අදාළ තොරතුරු හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් පනවනු ලබන දඩ මුදල වැඩි කිරීම වේ.

***8 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) මුදල් විශුද්ධිකරණය වරද සිදු කිරීම සඳහා භාවිත කර තිබිය හැකි යම් දේපළක් හෝ අනුරූප වටිනාකමකින් යුත් දේපළක් සම්බන්ධයෙන් ක්‍රියා විරහිත කිරීමේ නියමයක් නිකුත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම; සහ

(ආ) ක්‍රියා විරහිත කිරීමේ නියමයක් උල්ලංඝනය කිරීම සඳහා වන දණ්ඩනය වැඩි කිරීම,

වේ.

***9 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) ක්‍රියා විරහිත කිරීමේ නියමයක් තහවුරු කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා අදාළ වන කාලසීමාව සහ ක්‍රියා විරහිත කිරීමේ නියමයක් දීර්ඝ කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම; සහ

(ආ) මහාධිකරණය විසින් ක්‍රියා විරහිත කිරීමේ නියමයක් පිළිබඳ දැන්වීමක් පළ කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම,

වේ.

***10 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අධිකරණයේ අවසර සහිතව හැර, ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් දේපළකට අදාළ ගනුදෙනු තහනම් කිරීම වේ.

***11 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ක්‍රියා විරහිත කිරීමේ නියමයකට යටත් දේපළ සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය ගනුදෙනුවලට අවසර ලබාදීමට විධිවිධාන සැලැස්වීම වේ.

***12 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ක්‍රියා විරහිත කිරීමේ නියමයකට යටත් දේපළ ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, කළමනාකරණය කිරීම සහ බැහැර කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***13 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ක්‍රියා විරහිත කිරීමේ නියමයකට යටත් දේපළෙහි හිමිකාරීත්වය, සන්තකය ආදිය නිර්ණය කරගැනීම සඳහා, එකී දේපළෙහි සන්තකය පොලිස් නිලධරයකුහට ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***14 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින්, ක්‍රියා විරහිත කිරීමේ නියමයකට යටත් දේපළකට සම්බන්ධ වෙනත් යම් දේපළක් සම්බන්ධයෙන් ක්‍රියා විරහිත කිරීමේ නියමයක් නිකුත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීමට ප්‍රධාන ප්‍රඥප්තියට 12අ වන අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලැබේ.

***15 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) යම් තැනැත්තකු මුදල් විශුද්ධිකරණය සඳහා වරදකරු කිරීම මත සාපරාධී දේපළ හෝ අනුරූප වටිනාකමකින් යුත් දේපළ රාජ සන්තක කිරීම; සහ

(ආ) රාජසන්තක කිරීමේ ආඥාවක් හේතුවෙන් විඳීමට සිදු වූ යම් අලාභයක් සඳහා වන්දි ලබා ගැනීම වෙනුවෙන් අධිකරණයෙන් ඉල්ලුම් කිරීම,

සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***16 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ක්‍රියා විරහිත කිරීමේ නියමයකට යටත් දේපළ මත සද්භාවී හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම් නැවත පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***17 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ රාජසන්තක කරන ලද දේපළ 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ විධිවිධානවලට අනුකූලව බැහැර කිරීම වේ.

***18 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට 17අ, 17ආ, 17ඇ, 17ඈ සහ 17ඉ අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර එම අලුත් වගන්ති මඟින් -

(අ) විමර්ශනයකට යටත් වූ තැනැත්තකු විසින් දිවුරුම් ප්‍රකාශයක් හෝ දිවුරා ලබා දුන් ප්‍රකාශයක් සැපයීම සහ එම දිවුරුම් ප්‍රකාශයේ සහ දිවුරා ලබා දුන් ප්‍රකාශයේ ආවේශ්‍යතාව;

(ආ) බොරු සාක්ෂි දීම වෙනුවෙන් දණ්ඩනයක් පැනවීම; සහ

(ඇ) භාවිත කරනු ලැබිය යුතු විශේෂ විමර්ශන ක්‍රමවේද සහ විමර්ශනයක් පවත්වන විට හවුල් විමර්ශන කණ්ඩායමක් පිහිටුවීම,

පිළිබඳ විධිවිධාන සලස්වනු ලැබේ.

***19 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 12 වන වගන්තිය මඟින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***20 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වන වැරදි සඳහා පනවා තිබෙන දණ්ඩන වැඩි කිරීම වේ.

***21 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට 21 වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ විදේශීය නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයක් සමඟ අධිකරණ නඩු කටයුතුවල තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***22 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ රාජසන්තක කරන ලද දේපළ නැතහොත් එම දේපළෙහි වටිනාකම විදේශ රටකට පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***23 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින්, පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***24 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ශ්‍රී ලංකා ආණ්ඩුව සහ විදේශීය රටවල් අතර සහයෝගීතාව සලසා ගැනීම සම්බන්ධයෙන් 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත අදාළ කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***25 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින්, පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***26 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින්, පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***27 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින්, පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***28 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින්, පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***29 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ දේපළ රාජසන්තක කිරීම සම්බන්ධ නඩු කටයුතුවල දී වෙනත් රටවලට සහාය සැලසීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***30 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ නියෝග ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු කාලසීමාව නිශ්චිතව දැක්වීම වේ.

***31 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, එමඟින් ඇතැම් අතිරේක අර්ථ නිරූපණ ඇතුළත් කරනු ලැබේ.

එල්.ඩී.-ඕ. 41/2021

## 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක   දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2006 අංක 5 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මේ පනතේ ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ 2 වන වගන්තිය, ඒ වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

''(ඇ) මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ දී සිදු කරන ලද වරදක් සංයුක්ත වන ක්‍රියාවක්;

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් අධිකරණ බල සීමාවක් තුළ සිදු කරන ලද, එම අධිකරණ බල සීමාව තුළ මුදල් විශුද්ධිකරණය වරදට අනුරූප වරදක් සංයුක්ත වන නැතහොත් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබුවේ නම් මේ පනතේ අර්ථානුකූලව මුදල් විශුද්ධිකරණය වරද හෝ නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සංයුක්ත වන ක්‍රියාවක්;

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් අධිකරණ බල සීමාවක් තුළ (ඈ) ඡේදයේ සඳහන් ක්‍රියාවක් සිදු කරන තැනැත්තකු; සහ

(ඊ) සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද මේ පනත යටතේ වූ වරදක් සංයුක්ත වන ක්‍රියාවක්,''.

PL - 15662 - 465 (2026/02)

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) `එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) "යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලකින් " යන වචන යෙදී ඇති සෑම තැනක ම, ඒ වචන වෙනුවට "යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලකින් හෝ එම දේපළෙහි යම් පරිවර්තනය කිරීමකින්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ -

(i) "ලත් මුදලකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධ වූ යම් දේපළක් භාරගන්නා, සන්තකයේ තබා ගන්නා, සඟවා ගන්නා, බැහැර කරන" යන වචන වෙනුවට "ලත් මුදලකින් හෝ එම දේපළෙහි යම් පරිවර්තනය කිරීමකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධ වූ යම් දේපළක් භාවිත කරන, මිල දී ගන්නා, භාර ගන්නා, සන්තකයේ තබා ගන්නා, සඟවා ගන්නා, බැහැර කරන, පවරන" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ii) "ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන," යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඈ) ඍජුව ම හෝ වක්‍රව යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලකින් හෝ එම දේපළෙහි යම් පරිවර්තනය කිරීමකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධ වූ යම් දේපළක අර්ථලාභී අයිතිය අත්කර ගන්නා,"; සහ

(ඇ) "අවුරුදු පහකට නොඅඩු හා අවුරුදු" යන වචන වෙනුවට "අවුරුදු" යන වචනය ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "කිරීමට ආධාර හෝ අනුබල දෙන" යන වචන වෙනුවට "කිරීමට ආධාර හෝ අනුබල දෙන හෝ එම වරද කිරීමට වෙනත් තැනැත්තන්ට පහසුකම් සලසන හෝ උපදෙස් දෙන" යන වචන ආදේශ කිරීමෙන්"; සහ

(3) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 3අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 3අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"සැක දුරු කිරීම.

**3අ.** සැක දුරු කිරීම පිණිස-

(අ) මුදල් විශුද්ධිකරණය වරද ඔප්පු කිරීම සඳහා නීතිවිරෝධී ක්‍රියාකාරකම සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීමක් අවශ්‍ය නොවිය යුතු බවට; සහ

(ආ) මේ පනතේ විධිවිධාන මගින්, යම් තැනැත්තකු මුදල් විශුද්ධිකරණය වරදට චෝදනා කරනු ලැබීමට හෝ වරදකරු කරනු ලැබීමට අමතරව නීතිවිරෝධී ක්‍රියාකාරකමකට ද චෝදනා කරනු ලැබීම හෝ වරදකරු කරනු ලැබීම වළක්වනු නොලැබිය යුතු බවට,

මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ “යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලක්” යන වචන වෙනුවට “යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලකින් හෝ එම දේපළෙහි යම් පර්වර්තනය කිරීමකින්” යන වචන ආදේශ කිරීමෙන් සහ “සලකනු ලැබිය යුතු ය.” යන වචන වෙනුවට “පූර්වනිගමනය කරනු ලැබිය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ “රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකින්” යන වචන වෙනුවට “රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකින්” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ “රුපියල් ලක්ෂ එකක් නොඉක්මවන දඩයකින්” යන වචන වෙනුවට “රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකින්” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) යම් තැනැත්තකු මුදල් විශුද්ධිකරණය වරදට සම්බන්ධ යම් ක්‍රියාකාරකමක යෙදී සිටින බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින්නා වූ ද, එම වරදට අදාළව වැඩිදුරටත් ක්‍රියා සිදු කිරීම වැළැක්වීම හෝ සාපරාධී දේපළ බවට සාධාරණ ලෙස විශ්වාස කරනු ලබන දේපළ උත්සර්ජනය කිරීම වැළැක්වීම අවශ්‍ය වන්නා වූ ද අවස්ථාවක, සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්, එම වරද සඳහා උපයෝගී කරගෙන තිබිය හැකි හෝ උපයෝගී කර ගැනීමට අරමුණු කරගෙන තිබිය හැකි එම දේපළ පිළිබඳ හෝ එම දේපළේ වටිනාකමට අනුරූප වටිනාකමකින් යුත් යම් දේපළක් පිළිබඳ කවර හෝ ගනුදෙනුවක් තහනම් කරමින් (මෙහි මින්මතු "ක්‍රියා විරහිත කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් නිකුත් කරනු ලැබිය හැකි ය.";

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්-

"(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන ක්‍රියා විරහිත කිරීමේ නියමයක්-

(අ) (i) ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් දේපළෙහි සන්තකය, පදිංචිය හෝ පාලනය දරන හෝ එම දේපළෙන් යම් ප්‍රතිලාභ භුක්ති විඳින යම් තැනැත්තකු වෙත; හෝ

(ii) ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් දේපළ කෙරෙහි සම්බන්ධතාවක් ඇති බවට විශ්වාස කරනු ලබන යම් තැනැත්තකු වෙත; සහ

(ආ) එම ක්‍රියා විරහිත කිරීමේ නියමය ක්‍රියාත්මක කිරීමට නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු හෝ ආයතනයක් වෙත,

භාරදීම හෝ සන්නිවේදනය කිරීම කරනු ලැබිය යුතු ය.'';

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ ''දින හතක කාලසීමාවක්'' යන වචන වෙනුවට ''වැඩ කරන දින දාහතරක කාලසීමාවක්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) එම වගන්තියේ (4) වන උපවගන්තියේ-

(අ) ''රුපියල් ලක්ෂ එකක්'' යන වචන වෙනුවට ''රුපියල් මිලියන පහක්'' යන වචන;

(ආ) ''ගිණුමේ, දේපළෙහි හෝ ආයෝජනයේ'' යන වචන වෙනුවට ''දේපළෙහි'' යන වචන; සහ

(ඇ) ''එක් අවුරුද්දක් නොඉක්මවන'' යන වචන වෙනුවට ''අවුරුදු දෙකක් නොඉක්මවන'' යන වචන,

ආදේශ කිරීමෙන්.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ ''දින හත'' යන වචන යෙදෙන සෑම තැනක ම ඒ වචන වෙනුවට, ''වැඩ කරන දින දාහතර'' යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ “මාස තුනක් නොඉක්මවිය යුතු අතර,” යන වචන වෙනුවට “මාස හතරක් නොඉක්මවිය යුතු අතර,” යන වචන සහ “අවුරුදු දෙකක කාලසීමාවක්” යන වචන වෙනුවට “අවුරුදු තුනක කාලසීමාවක්” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම උපවගන්තියේ අතුරු විධානයේ “ගිණුමට, දේපළට හෝ ආයෝජනයට අදාළව,” යන වචන වෙනුවට “දේපළට අදාළව,” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

“(3) මහාධිකරණය විසින් (2) වන උපවගන්තිය යටතේ ක්‍රියා විරහිත කිරීමේ නියමයක් තහවුරු කරනු ලැබූ අවස්ථාවක, එම ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් දේපළ කෙරෙහි වූ තම හිමිකම්පෑම් සනාථ කරමින් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට සද්භාවී තුන්වන පාර්ශවවලට පහසුකම් සැලසීම පිණිස, අධිකරණය විසින් එම ක්‍රියා විරහිත කිරීමේ නියමය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි හෝ යටත් පිරිසෙයින්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ කර බෙදාහරින එක් පුවත්පතකවත් පළ කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“ක්‍රියා විරහිත කිරීමේ නියමය උල්ලංඝනය කරමින් සිදු කරන ගනුදෙනු ශූන්‍ය හා බල රහිත බව.

**9.** 10 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි අධිකරණයේ අවසරය ඇතිව මිස, ක්‍රියා විරහිත කිරීමේ නියමය බලාත්මකව පවතින අතරතුර, ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් යම් දේපළක් පිළිබඳ යම් ගනුදෙනුවක් සිදු කරනු නොලැබිය යුතු

අතර, එසේ සිදු කරන ලද යම් ගනුදෙනුවක් ශූන්‍ය හා බල රහිත විය යුතු ය:

එසේ වුවද, එම දේපළෙහි කොටසක් වන හෝ එම දේපළ ම සංයුක්ත වන යම් ගිණුමකට උපචිත වන යම් ලැබීම් කිසිවක් ඇත්නම්, එම ලැබීම් එම ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.”.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

“මහාධිකරණය විසින් අත්‍යවශ්‍ය හා නීත්‍යනුකූල ගනුදෙනුවලට අවසර දිය හැකි බව.

**10.** 7 වන වගන්තිය යටතේ කරන ලද ක්‍රියා විරහිත කිරීමේ නියමයක් තහවුරු කිරීමේ දී, එම නියමයෙන් බලපෑමට ලක්වන යම් තැනැත්තකුගේ නීත්‍යනුකූල ව්‍යාපාරයකට හෝ වෙනත් සම්බන්ධතාවලට එමගින් හානියක් විය හැකි බව සහ එම ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් දේපළ පිළිබඳ යම් අත්‍යවශ්‍ය ගනුදෙනුවක් නීත්‍යනුකූලව සිදු කරනු ලැබිය හැකි බව මහාධිකරණයේ මතය වේ නම්, තත්කාර්යය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත හෝ ස්වකීය අභිමතය මත, මහාධිකරණය විසින්-

(අ) එම ගනුදෙනුව සිදු කිරීම සඳහා අවසර දෙන; හෝ

(ආ) 11 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, පත් කරනු ලැබිය හැකි ප්‍රතිග්‍රාහකයාගේ හෝ විශේෂ කළමනාකරුගේ අධීක්ෂණය යටතේ හෝ එම වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි කරනු ලැබිය හැකි විධානයක් අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය

වෙත කර, එම අධිකාරියේ අධීක්ෂණය යටතේ එම ගනුදෙනුව සිදු කිරීම සඳහා අවසර දෙන,

ආඥාවක් කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“ක්‍රියා විරහිත කිරීමේ නියමයක් තහවුරු කිරීමෙන් පසු ප්‍රතිග්‍රාහකයකු ආදිය පත් කිරීම.

**11.**(1)8 වන වගන්තිය යටතේ මහාධිකරණය විසින් ක්‍රියා විරහිත කිරීමේ නියමයක් තහවුරු කිරීමෙන් පසුව, සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්, ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් දේපළ ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ, කළමනාකරණය කිරීමේ හෝ බැහැර කිරීමේ කාර්යය සඳහා 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ IV වන කොටස ප්‍රකාරව, අවස්ථාවෝචිත පරිදි, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත්කිරීම සඳහා හෝ අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය වෙත විධානයක් කිරීම සඳහා වූ ආඥාවක් ලබා ගැනීම පිණිස මහාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) මහාධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් මත හෝ ස්වකීය අභිමතය මත, ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් දේපළ ආරක්ෂා කිරීමේ, සංරක්ෂණය කිරීමේ, කළමනාකරණය කිරීමේ හෝ බැහැර කිරීමේ කාර්යය සඳහා 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ IV වන කොටසේ අන්තර්ගත විධිවිධාන ප්‍රකාරව, අවස්ථාවෝචිත පරිදි, ප්‍රතිග්‍රාහකයකු හෝ විශේෂ කළමනාකරුවකු පත්කිරීම හෝ අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය වෙත විධාන කිරීම කරනු ලැබිය හැකි ය.”.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන යම් පොලිස් නිලධරයකු විසින්, ක්‍රියා විරහිත කිරීමේ නියමයකට යටත් දේපළ සන්තකයට ගැනීම සහ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් කටයුතු කිරීම කරනු ලැබිය යුතු අතර, එම පොලිස් නිලධරයා හෝ සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන වෙනත් යම් පොලිස් නිලධරයකු විසින් කරන ලද ඉල්ලීමක් මත සහ එම ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් දේපළේ අයිතිය, සන්තකය, අර්ථලාභී අයිතිය හෝ එම දේපළේ පාලනය දරන තැනැත්තා නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා, අධිකරණය විසින්-

(අ) (i) එම දේපළ අනාවරණය කර ගැනීම, සොයා යාම හෝ තිබෙන ස්ථානය සොයා ගැනීම;

(ii) එම දේපළ හඳුනා ගැනීම හෝ ප්‍රමාණීකරණය;

(iii) එම දේපළෙහි අයිතිය, සන්තකය, අර්ථලාභී අයිතිය හෝ පාලනය තහවුරු කර ගැනීම; හෝ

(iv) එම දේපළට අදාළ වෙනත් යම් තොරතුරු ලබා ගැනීම,

සඳහා අදාළ වන යම් ලේඛනයක් වහාම එම පොලිස් නිලධරයා වෙත භාරදිය යුතු බවට වන; සහ

(ආ) ස්වකීය ආඥාවෙහි නම් කරන ලද යම් ආයතනයක් විසින්, ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් දේපළට අදාළව හෝ එම දේපළ සම්බන්ධයෙන් එම ආයතනය විසින් ලබාගත් සියලු ලේඛන සහ තොරතුරු හෝ අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි පරිදි, එම දේපළ සම්බන්ධයෙන් එම ආයතනය විසින් සිදු කරන ලද ව්‍යාපාරික ගනුදෙනුවලට අදාළ යම් තොරතුරු එම පොලිස් නිලධරයා වෙත ලබාදිය යුතු බවට වන,

ආඥාවක් කරනු ලැබිය හැකි ය.''; සහ

(2) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්: -

"(3) ක්‍රියා විරහිත කිරීමේ නියමයකට යටත් යම් දේපළක අයිතිය, සන්තකය, අර්ථලාභී අයිතිය හෝ එම දේපළේ පාලනය දරන තැනැත්තා නිශ්චය කර ගැනීමෙන් පසුව, එම පොලිස් නිලධරයා විසින්, ඒ පිළිබඳව ලබාගෙන ඇති, අවස්ථාවෝචිත පරිදි, එම අයිතිය, සන්තකය, අර්ථලාභී අයිතිය හෝ පාලනය තහවුරු කරන සහ සනාථ කරන සියලු ලේඛන සහ තොරතුරු ද සමඟ (1) වන උපවගන්තිය යටතේ වන ආඥාව කරන ලද අධිකරණය වෙත ඒ පිළිබඳව වාර්තා කරනු ලැබිය යුතු ය.''.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 12අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:- ප්‍රධාන ප්‍රඥප්තියට 12අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

"දේපළට සම්බන්ධ වෙනත් යම් දේපළක් ක්‍රියා විරහිත කිරීමේ නියමයකට යටත් විය යුතු බව.

**12අ.** 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ භාරදිය යුතු බවට හෝ ලබාදිය යුතු බවට ආඥා කරන ලද යම් ලේඛනයක් හෝ තොරතුරක් ලැබීමෙන් පසුව, වෙනත් යම් දේපළක් -

(අ) 7 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් දේපළට සම්බන්ධ බවට; හෝ

(ආ) යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ව්‍යුත්පන්න වී ඇති බවට හෝ උපලබ්ධ වී ඇති බවට සහ ඒ වෙනත් දේපළ ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් දේපළට සම්බන්ධ බවට,

විශ්වාස කිරීමට එම පොලිස් නිලධරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක, එම පොලිස් නිලධරයා විසින්, එම වෙනත් දේපළ සම්බන්ධයෙන් 7 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා විරහිත කිරීමේ නියමයක් නිකුත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධන කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්: -

"(1) 3 වන වගන්තිය යටතේ වන වරදකට යම් තැනැත්තකු වරදකරු කරන ලද අවස්ථාවක, අධිකරණය විසින්, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව-

(අ) වරදකරු කරනු ලැබූ තැනැත්තා හෝ වෙනත් යම් තැනැත්තකු විසින් අයිතිය දරන හෝ සන්තකය දරන හෝ වරදකරු කරනු ලැබූ

තැනැත්තාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ පාලනය යටතේ ඇති සාපරාධී දේපළ;

(ආ) වරදකරු කරනු ලැබූ තැනැත්තාට හෝ වෙනත් යම් තැනැත්තකුට අර්ථලාභී අයිතියක් ඇති සාපරාධී දේපළ; හෝ

(ඇ) එම සිද්ධියට අදාළ අවස්ථානුගත කරුණු අනුව එසේ අවශ්‍ය කරන්නේ නම්, එම සාපරාධී දේපළේ වටිනාකමට අනුරූප වටිනාකමකින් යුත් යම් දේපළක්,

සියලු බැඳීම්වලින් නිදහස්ව රජය සතු කළ යුතු බවට ආඥා කරනු ලැබිය යුතු ය.";

(2) එම වගන්තියේ (1අ) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්: -

"(1අ) එම සාපරාධී දේපළ සොයාගත නොහැකි හෝ අනාවරණය කරගත නොහැකි අවස්ථාවක, එම තැනැත්තා වරදකරු කරනු ලබන අධිකරණය විසින්, එම සාපරාධී දේපළේ අනුරූප වටිනාකම රජයට ගෙවන ලෙස වරදකරු කරනු ලැබූ තැනැත්තාට හෝ (1) වන උපවගන්තියේ සඳහන් වෙනත් යම් තැනැත්තාට ආඥා කරනු ලැබිය යුතු ය.";

(3) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්: -

"(2) අධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ රාජසන්තක කිරීමේ ආඥාවක් කිරීමට පෙරාතුව, එය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය

හැකි යම් පරීක්ෂණයකින් පසු සම්භාව්‍යතා වැඩි බර අනුව, එම ආඥාව හේතුවෙන්-

(අ) එම සාපරාධී දේපළ ප්‍රතිෂ්ඨාවක් මත සද්භාවයෙන් මිල දී ගත් තැනැත්තකුගේ;

(ආ) එම සාපරාධී දේපළ කෙරෙහි ප්‍රතිෂ්ඨාවක් මත සද්භාවී සම්බන්ධතාවක් අත්කර ගෙන ඇති වෙනත් යම් තැනැත්තකුගේ; හෝ

(ඇ) එම සාපරාධී දේපළ කෙරෙහි සද්භාවී සම්බන්ධතාවක් ඇති තුන්වන පාර්ශ්වයකගේ,

අයිතිවාසිකම්වලට අගතියක් වීමට ඉඩ තිබේ ද යන්න නිශ්චය කරනු ලැබිය යුතු ය.";

(4) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(2අ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද රාජසන්තක කිරීමේ ආඥාවකින් බලපෑමට ලක් වූ යම් තැනැත්තකු විසින්, එම ආඥාව කිරීමෙන් දින තිහක කාලසීමාවක් ඇතුළත, එම ආඥාවේ ප්‍රතිඵලයක් ලෙස තමාට අලාභයක් සිදු වී ඇති බව සඳහන් කරමින්, වන්දි ලබා ගැනීම සඳහා එම ආඥාව කරන ලද අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2ආ) (2අ) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, රාජසන්තක

කිරීමේ ආඥාව කරන ලද අධිකරණය විසින්, එම ආඥාවේ ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුම්කරුට අලාභයක් සිදු වී ඇති බවට සෑහීමට පත්වීමෙන් පසු, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, රාජසන්තක කරන ලද දේපළෙන් එම තැනැත්තාට වන්දි ගෙවන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය.'' ; සහ

(5) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්: -

''(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක්-

(අ) එම රාජසන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අධිකරණ බලය ඇති අධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක හෝ එවැනි අභියාචනයක් එම අධිකරණය ඉදිරියෙහි විභාග වෙමින් පවතින අවස්ථාවක, එම අභියාචනය සම්බන්ධයෙන් එම රාජසන්තක කිරීමේ ආඥාව තහවුරු කරන හෝ ස්ථිර කරන තීරණයක් දෙනු ලැබූ විට; හෝ

(ආ) එම රාජසන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අධිකරණ බලය ඇති අධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා අවසර දී ඇති කාලසීමාව ඇතුළත ඊට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, එම

රාජසන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනයක් කළ හැකි කාලසීමාව අවසන් වීමෙන් පසු,

බලාත්මක වන්නේ ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්: -

''(1) මේ පනත යටතේ වන යම් වරදක් සිදු කර නොමැත්තා වූ හෝ ඒ යම් වරදකට සම්බන්ධ වී නොමැත්තා වූ, සහ 7 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් යම් දේපළක අයිතිය දරන්නා වූ, සන්තකය දරන්නා වූ හෝ එහි අර්ථලාභී අයිතිය ඇත්තා වූ හෝ එහි පාලනය දරන්නා වූ යම් තැනැත්තකු විසින්, 8 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ වන දැන්වීම පළ කිරීමෙන් දින තිහක් ඇතුළත, ඔහු විසින් අයිතිය දරන, සන්තකය දරන, ඔහුට අර්ථලාභී අයිතිය ඇති හෝ ඔහු විසින් පාලනය දරන යම් දේපළක් එම නියමයෙන් බැහැර කිරීම සඳහා අධිකරණයේ මැදිහත් වීම අපේක්ෂා කරමින් ක්‍රියා විරහිත කිරීමේ නියමය තහවුරු කරන ලද අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.''; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ ''ගිණුම, දේපළ හෝ ආයෝජනය'' යන වචන යෙදෙන සෑම තැනක ම ඒ වචන වෙනුවට ''ක්‍රියා විරහිත කිරීමේ නියමයට යටත් දේපළ'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම උපවගන්තියේ (අ) ඡේදයේ "ඉල්ලුම්කරුට හිමිකාරත්වය ඇති හෝ ඔහුගේ සන්තකය හෝ පාලනය යටතේ ඇති" යන වචන වෙනුවට "ඉල්ලුම්කරු විසින් අයිතිය දරන, සන්තකය දරන හෝ ඉල්ලුම්කරුට අර්ථලාභී අයිතිය ඇති හෝ ඉල්ලුම්කරු විසින් පාලනය දරන" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"රාජසන්තක කිරීමෙන් පසු දේපළ බැහැර කිරීම.

**15.** 13 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් යම් සාපරාධී දේපළක් හෝ එම සාපරාධී දේපළේ වටිනාකමට අනුරූප වටිනාකමකින් යුත් දේපළක් රාජසන්තක කර ඇති අවස්ථාවක, අධිකරණය විසින්, එකී දේපළ 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ විධිවිධානවලට අනුව බැහැර කරන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 17අ, 17ආ, 17ඇ, 17ඈ සහ 17ඉ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 17අ වන වගන්තිය, 17ආ වන වගන්තිය, 17ඇ වන වගන්තිය, 17ඈ වන වගන්තිය සහ 17ඉ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"තැනැත්තකු විසින්පොලිස් නිලධරයා වෙත දිවුරුම් ප්‍රකාශයක් හෝ දිවුරා ලබා දුන් ප්‍රකාශයක් ලබාදිය යුතු බව.

**17අ.** 3 වන වගන්තිය යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයකට යටත් යම් තැනැත්තකු විසින්, එම තැනැත්තා විසින් අත්කර ගනු ලැබූ යම් සැකකටයුතු දේපළක් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධ වූ ආකාරය විස්තර කරනු ලබන්නා වූ ද, විමර්ශනයට භාජනය වී ඇති කාරණා සම්බන්ධයෙන් හෝ විමර්ශනයට භාජනය වී ඇති කාරණාවලට අදාළ යම් සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් එම පොලිස් නිලධරයා විසින් ඔහුගෙන් අසන යම් ප්‍රශ්නයකට පිළිතුරු සපයන්නා වූ ද දිවුරුම් ප්‍රකාශයක් හෝ දිවුරා

ලබා දුන් ප්‍රකාශයක් එම විමර්ශනය භාරව සිටින, සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු වෙත ලබාදිය යුතු ය:

එසේ වුව ද, තමා අපරාධමය චෝදනාවකට හෝ දණ්ඩනයකට හෝ රාජසන්තක කිරීමකට ලක් කිරීමට ඉඩ ඇති යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ස්වයං අපරාධාරෝපණ හෝ අපරාධෝච්චාරණ ප්‍රකාශයක් හෝ දිවුරුම් ප්‍රකාශයක් හෝ පිළිතුරක් ලබාදීමට 3 වන වගන්තිය යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයකට යටත් තැනැත්තකුට බැඳීමක් නොතිබිය යුතු ය.

දිවුරුම් ප්‍රකාශයක හෝ දිවුරා ලබා දුන් ප්‍රකාශයක ආවේශ්‍යතාව.

**17ආ.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, 17අ වන වගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් පොලිස් නිලධරයකු වෙත ලබාදුන් දිවුරුම් ප්‍රකාශයක් හෝ දිවුරා ලබා දුන් ප්‍රකාශයක් 3 වන වගන්තිය යටතේ වන වරදක් සම්බන්ධයෙන් එම තැනැත්තාට විරුද්ධව වූ නඩුවිභාගයේ දී සාක්ෂියක් ලෙස අදාළ සහ ආවේශ්‍ය විය යුතු ය.

බොරු සාක්ෂි දීම.

**17ඇ.** (1) 3 වන වගන්තිය යටතේ වන වරදක් සම්බන්ධයෙන් වන නඩු විභාගයක දී සාක්ෂි දෙන යම් තැනැත්තකු විසින්, එම නඩු විභාගය පවත්වනු ලබන්නේ යම් අධිකරණයක් ඉදිරියෙහි ද එම අධිකරණයේ මතය අනුව, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 188 වන වගන්තියේ අර්ථානුකූලව බොරු සාක්ෂි ලබා දුනහොත්, එම අධිකරණය විසින් ළඟු නඩු විභාගයකින් පසු එම සාක්ෂිකරුට අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකින් හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකින් හෝ දඬුවම් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන යම් නඩු විභාගයක දී, එම තැනැත්තා විසින් පරස්පර විරෝධී ප්‍රකාශ සිදු කර ඇති බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු අතර, එම ප්‍රකාශ අතුරින් කුමන ප්‍රකාශ අසත්‍ය ද යන්න ඔප්පු කිරීම අවශ්‍ය නොවිය යුතු ය.

විමර්ශනයක් සිදු කිරීමේ දී භාවිත කළ යුතු විශේෂ විමර්ශන ක්‍රමවේද.

**17**ඈ. (1) මේ පනත යටතේ විමර්ශනයක් සිදු කරන යම් පොලිස් නිලධරයකු විසින්, විමර්ශනය සිදු කිරීමේ දී, වෙනත් යම් ලිඛිත නීතියකින් එම පොලිස් නිලධරයා වෙත පැවරී ඇති බලතලවලට අමතරව, පහත දැක්වෙන ක්‍රමවේද ද ඇතුළුව යම් විමර්ශන ක්‍රමවේද භාවිත කරනු ලැබිය හැකි ය:-

(අ) ආවේක්ෂණය සහ නිරීක්ෂණය;

(ආ) ආවරණ මෙහෙයුම්;

(ඇ) වීඩියෝ පටිගත කිරීම;

(ඈ) සවන්දීමේ උපාංග භාවිත කිරීම;

(ඉ) පාලනය කරන ලද භාරදීම්; හෝ

(ඊ) පරිගණක දත්ත සහ පරිගණක පද්ධති වෙත ප්‍රවේශ වීම.

(2) සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්, (1) වන උපවගන්තියේ (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේදවල කාර්ය සඳහා ආඥාවක් ලබාගැනීම පිණිස ප්‍රමාණවත් කරුණු ද සමඟ ඒකපාර්ශ්වික ඉල්ලීමක් රහසිගතව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ විමර්ශන සිදු කරන නිලධරයකුට යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වන වරදක් සිදුකර ඇති බවට හෝ සිදු

කරමින් සිටින බවට හෝ සිදු කිරීමට ආසන්න බවට සැක කිරීමට හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින්නේ නම්, යම් ක්‍රියාකලාපයක් රහසිගත ලෙස නිරීක්ෂණය කිරීම සහ යම් සන්නිවේදනයක් පටිගත කිරීම සඳහා බලය දෙන වරෙන්තුවක් ලබාගැනීම සඳහා වන ලිඛිත ඉල්ලීමක් සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්, මහෙස්ත්‍රාත්වරයා වෙත කරනු ලැබිය හැකි ය.

(4) විමර්ශනය සිදු කරන නිලධරයා විසින් ලබාගත් හෝ රැස්කර ගත් තොරතුරු ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා වගබලා ගැනීම (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීම කරන නිලධරයාගේ කාර්යය විය යුතු ය.

හවුල් විමර්ශන කණ්ඩායමක් පිහිටුවීම.

**17ඉ.** (1) අදාළ සිද්ධියේ අවස්ථානුගත කරුණු අනුව එසේ කිරීම සාධාරණීකරණය කෙරෙන අවස්ථාවක-

(අ) 3 වන වගන්තිය යටතේ වන වරදක්; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් අධිකරණ බල සීමාවක් තුළ සිදු කරන ලදැයි චෝදනා කරනු ලබන, එම අධිකරණ බල සීමාව තුළ මුදල් විශුද්ධිකරණය වරදට අනුරූප වරදක් සංයුක්ත වන නැතහොත් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබුවේ නම් මේ පනතේ අර්ථානුකූලව මුදල් විශුද්ධිකරණය වරද හෝ නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සංයුක්ත වන ක්‍රියාවක්,

සම්බන්ධයෙන්වි මර්ශනයක් සිදු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, ශ්‍රී ලංකා පොලිසිය සහ ශ්‍රී ලංකාව

තුළ හෝ වෙනත් යම් අධිකරණ බල සීමාවක් තුළ විමර්ශන සිදු කිරීමේ බලය ඇති වෙනත් යම් අධිකාරියක් අතර ඇති කරගනු ලැබූ එකඟතාවයක් මගින් යම් නිශ්චිත කාලසීමාවක් සඳහා හවුල් විමර්ශන කණ්ඩායමක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) විමර්ශනයට භාජනය කරන ලද තැනැත්තන්ට විරුද්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණවල දී නඩු විභාග කරනු ලබන අවස්ථාවක දී, හවුල් විමර්ශනවල දී ලබාගත් යම් සාක්ෂියක් හෝ කරුණක් එම අධිකරණ විසින් භාවිත කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ "3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් සහ "අධිකාරියේ විධානය පරිදි වූ" යන වචන වෙනුවට "මූල්‍ය බුද්ධි ඒකකයේ විධානය පරිදි වූ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඇ) යම් ප්‍රතිග්‍රාහකයකු, විශේෂ කළමනාකරුවකු හෝ අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය විසින් හෝ යම් ප්‍රතිග්‍රාහකයකුගේ, විශේෂ කළමනාකරුවකුගේ හෝ අපරාධයකින්

උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරියේ අධිකාරය යටතේ යම් ක්‍රියාකාරකමක් සිදු කරන යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබූ බවට උද්දේශිත යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සම්බන්ධයෙන් එම ප්‍රතිග්‍රාහකයාට, විශේෂ කළමනාකරුට හෝ අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරියට හෝ එම තැනැත්තාට විරුද්ධව,'';

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ ''අධිකාරිය වෙනුවෙන්'' යන වචන වෙනුවට ''මූල්‍ය බුද්ධි ඒකකය වෙනුවෙන්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

''මේ පනත යටතේ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.''.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම*

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ ''රුපියල් පනස් දහසක් නොඉක්මවන'' යන වචන වෙනුවට ''රුපියල් මිලියන පහක් නොඉක්මවන'' යන වචන සහ ''අවුරුදු එකක් නොඉක්මවන'' යන වචන වෙනුවට ''අවුරුදු තුනක් නොඉක්මවන'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ, ''රුපියල් ලක්ෂ එකකට නොවැඩි'' යන වචන වෙනුවට ''රුපියල් මිලියන පහක් නොඉක්මවන'' යන වචන සහ ''මාස දොළහකට නොවැඩි'' යන වචන වෙනුවට ''අවුරුදු තුනක් නොඉක්මවන'' යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 21 වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"අධිකරණ නඩු කටයුතු පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම.

**21.** යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමක් හෝ යම් සාපරාධී දේපළක් හෝ එම සාපරාධී දේපළේ වටිනාකමට අනුරූප වටිනාකමකින් යුත් දේපළක් රාජසන්තක කිරීමක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, මේ පනත යටතේ වන වරදකට අදාළ යම් අධිකරණ නඩු කටයුත්තක දී වාර්තාගත කරන ලද යම් තොරතුරක් හෝ ඊට අදාළ යම් තීරණයක් හෝ නඩුතීන්දුවක් යම් විදේශීය නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයක් සමඟ හුවමාරු කරගනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"රාජසන්තක කළ දේපළ හෝ එහි වටිනාකම භාර දීම.

**22.** වෙනත් රටක හෝ විදේශීය රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ එම රට හෝ ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ඉල්ලීමක් කර ඇත්තාවූ ද, අන්තර්ජාතික වැඩපිළිවෙලක් අනුව එසේ කිරීම අවශ්‍ය වීම හෝ එසේ කිරීමට අවසර තිබීම හේතුවෙන් හෝ අන්‍යොන්‍ය මිත්‍රත්වයේ යහපත පිණිස එසේ කිරීම උචිත යයි විදේශ කටයුතු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසීමෙන් පසු අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නා වූ ද අවස්ථාවක, ඔහු විසින්, මේ පනතේ විධිවිධාන යටතේ රාජසන්තක කරන ලද යම් සාපරාධී දේපළක් හෝ එම සාපරාධී දේපළේ වටිනාකමට අනුරූප වටිනාකමකින් යුත් දේපළක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ එහි වටිනාකම, එම ඉල්ලීම කළ රට හෝ විදේශීය

රාජ්‍යය වෙත භාර දෙන ලෙස හෝ ප්‍රේෂණය කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, රාජසන්තක කිරීමේ ආඥාව බලාත්මක කිරීමේ දී හෝ එම දේපළ ආරක්ෂා කිරීමේ දී, සංරක්ෂණය කිරීමේ දී හෝ කළමනාකරණය කිරීමේ දී හෝ ඊට ආනුෂංගික කාරණාවල දී දරන ලද සැලකිය යුතු හෝ විශේෂිත පිරිවැය, එම දේපළ හෝ එහි වටිනාකම ඉල්ලීම කළ රට හෝ විදේශීය රාජ්‍යය වෙත භාරදීමට හෝ ප්‍රේෂණය කිරීමට පෙරාතුව අඩු කිරීම හෝ අයකර ගැනීම කළ යුතු ය.”.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) “ඉල්ලීම කරන රජයේ” යන වචන වෙනුවට “ඉල්ලීම කළ විදේශීය රාජ්‍යයේ” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ පැති සටහනේ “ඉල්ලීම කළ රජයට” යන වචන වෙනුවට “ඉල්ලීම කළ විදේශීය රාජ්‍යයට” යන වචන ආදේශ කිරීමෙන්.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

“විදේශීය රාජ්‍යවලට සහාය වීම ආදිය. **27.** 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ විධිවිධාන-

(අ) මුදල් විශුද්ධිකරණය වරද හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ දී, නඩු පැවරීමේ දී, රාජසන්තක

කිරීමේ දී හෝ ආඥා බලාත්මක කිරීමේ දී, හෝ ඒ හා සම්බන්ධ වෙනත් යම් නඩු කටයුත්තක දී; සහ

(ආ) යම් සාපරාධී දේපළක් හෝ එම සාපරාධී දේපළේ වටිනාකමට අනුරූප වටිනාකමකින් යුත් දේපළක් රාජසන්තක කිරීම සම්බන්ධයෙන් වන යම් නඩු කටයුත්තක දී,

ශ්‍රී ලංකා ආණ්ඩුව සහ යම් විදේශීය රාජ්‍යයක් හෝ නිශ්චිත රටක් හෝ නිශ්චිත සංවිධානයක් අතර සහයෝගීතාව පවත්වා ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ “රාජ්‍යයක” සහ “රාජ්‍යයේ” යන වචන යෙදී ඇති සෑම තැනක ම ඒ වචන වෙනුවට පිළිවෙළින් “විදේශීය රාජ්‍යයක” සහ “විදේශීය රාජ්‍යයේ” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ “රාජ්‍යයක”, “රාජ්‍යයේ”, සහ “රාජ්‍යයක්” යන වචන යෙදී ඇති සෑම තැනක ම ඒ වචන වෙනුවට පිළිවෙළින් “විදේශීය රාජ්‍යයක”, “විදේශීය රාජ්‍යයේ” සහ “විදේශීය රාජ්‍යයක්” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ පැති සටහනේ “වෙනත් රාජ්‍යවලට” යන වචන වෙනුවට “වෙනත් විදේශීය රාජ්‍යවලට” යන වචන ආදේශ කිරීමෙන්.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ “ඉල්ලීම කරන රාජ්‍යයේ” යන වචන වෙනුවට “ඉල්ලීම කළ විදේශීය රාජ්‍යයේ” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ “වෙනත් යම් රාජ්‍යයක” යන වචන වෙනුවට “වෙනත් යම් විදේශීය රාජ්‍යයක” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) “ඒ රාජ්‍යයේ නීතිය යටතේ වූ වරදකට පවරා තිබෙන අපරාධ නඩු කටයුත්තක් සම්බන්ධව” යන වචන වෙනුවට “ඒ විදේශීය රාජ්‍යයේ නීතිය යටතේ වූ වරදකට පවරා තිබෙන අපරාධ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් හෝ සාපරාධී දේපළ රාජසන්තක කිරීමට අදාළ නඩුකටයුතු සම්බන්ධයෙන්” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනේ “වෙනත් රාජ්‍යවලට” යන වචන වෙනුවට “වෙනත් විදේශීය රාජ්‍යවලට” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ "යම් ව්‍යාපාරයක් "මූල්‍යකරණය නොවන නාමෝද්දිෂ්ට ව්‍යාපාරයක්" ලෙස" යන වචන වෙනුවට "යම් ව්‍යාපාරයක් "නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක් හෝ වෘත්තියක්" ලෙස"යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින්" යන වචන වෙනුවට "එය ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට මාස තුනක් ඇතුළත" යන වචන සහ "සැලකිය යුතු ය." යන වචන වෙනුවට "සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ "(4) නියෝගයක් පරිච්ඡින්න" යන ඉලක්කමේ සහ වචනවල සිට ඒ වගන්තිය අවසානය තෙක් ඇති සියලු වචන ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"අර්ථ නිරූපණය.

**35.** පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"අර්ථලාභී අයිතිය" යන්නෙන් -

(අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 130ඒ වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි

වූ අර්ථලාභී අයිතිකරුවකු වන ස්වාභාවික තැනැත්තකු;

(ආ) (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ භාරයක් හෝ ප්‍රකාශිත භාරයකට සමාන වෙනත් යම් නෛතික වැඩපිළිවෙලක් සම්බන්ධයෙන් වන විට, එම ආඥාපනතේ 19අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන්ගේ තත්ත්වයට සමාන තත්ත්වයක් දරන ස්වාභාවික තැනැත්තකු;

(ඇ) (අ) සහ (ආ) ඡේද අදාළ නොවන අවස්ථාවක, අස්ථිත්වයක හෝ භාරයක හෝ වෙනත් නෛතික වැඩපිළිවෙලක ඍජුව ම හෝ වක්‍රව අත්‍යන්ත අයිතිය හෝ පාලනය දරන ස්වාභාවික තැනැත්තකු; හෝ

(ඈ) අස්ථිත්වයකට හෝ භාරයකට හෝ වෙනත් නෛතික වැඩපිළිවෙලකට අදාළව ගනුදෙනුවක් සිදු කරනු ලබන්නේ යම් ස්වාභාවික තැනැත්තකු වෙනුවෙන් ද, එවැනි ස්වාභාවික තැනැත්තකු,

විසින් අස්ථිත්වයක හෝ භාරයක හෝ වෙනත් නෛතික වැඩපිළිවෙලක අයිතිය හෝ පාලනය දැරීම අදහස් වේ;

“පරිගණක දත්ත” යන්නෙන්, පරිගණක පද්ධතියක් මඟින් යම් කර්තව්‍යයක් කිරීමට සැලැස්වීම සඳහා සුදුසු වැඩසටහනක් ද ඇතුළුව,

පරිගණක පද්ධතියක් තුළ සැකසීම සඳහා සුදුසු ආකාරයකින් කරුණු, තොරතුරු හෝ සංකල්ප නිරූපණය කිරීමක් අදහස් වේ;

''පරිගණක පද්ධතිය'' යන්නට, 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

''රට'' හෝ ''විදේශීය රාජ්‍යය'' යන්නට, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

''සාපරාධී දේපළ'' යන්නෙන්, සෘජුව ම හෝ වක්‍රව යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලකින් හෝ එම දේපළෙහි යම් පරිවර්තනය කිරීමකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධ වූ දේපළ අදහස් වන අතර, ඊට-

(අ) මුදල් විශුද්ධිකරණයෙන් හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් නැතහොත් මුදල් විශුද්ධිකරණයෙන් හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධ වූ ආදායම්, ලාභ, දේපළ හෝ වෙනත් ප්‍රතිලාභ ද;

(ආ) මුදල් විශුද්ධිකරණය හෝ නීතිවිරෝධී ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන ලද හෝ භාවිත කිරීමට අදහස් කරන ලද උපකරණ ද;

(ඇ) විශුද්ධිකරණය කරන ලද දේපළ ද;

(ඈ) ත්‍රස්තවාදය වෙනුවෙන් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවන් වෙනුවෙන්

මුදල් සැපයීම සඳහා භාවිත කරන ලද හෝ භාවිත කිරීමට අදහස් කරන ලද හෝ භාවිත කිරීම සඳහා වෙන් කරන ලද දේපළ හෝ යම් ලිඛිත නීතියක් යටතේ ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම් කරන ලද යම් සංවිධානයක දේපළ ද; සහ

(ඉ) ත්‍රස්තවාදය වෙනුවෙන් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවන් වෙනුවෙන් මුදල් සැපයීමෙන් ලත් මුදලක් හෝ යම් ලිඛිත නීතියක් යටතේ ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම් කරන ලද යම් සංවිධානයක දේපළ ද,

ඇතුළත් වේ;

"නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හෝ වෘත්තීන්" යන්නට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"දේපළ බැහැර කිරීම" යන්නට, එම දේපළ බෙදා ගැනීම සහ ආපසු දීම ද ඇතුළත් වේ;

"මූල්‍ය ව්‍යාපාරය" යන්නට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මූල්‍ය බුද්ධි ඒකකය" යන්නෙන්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය අදහස් වේ;

"ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම" යන්නෙන්, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ 3 වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ වරදක් අදහස් වේ;

"රාජසන්තක කිරීම" යන්නෙන්, යම් සාපරාධී දේපළක හෝ එම සාපරාධී දේපළේ වටිනාකමට අනුරූප වටිනාකමකින් යුත් දේපළක අයිතිය සියලු බැඳීම්වලින් නිදහස්ව රජයට පවරනු ලබන්නා වූ අධිකරණ ආඥාවක් මඟින් එම දේපළ ස්ථිර වශයෙන් අහිමි කිරීම අදහස් වේ;

"ආයතනය" යන්නට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ මේ පනත පිළිබඳ විෂයය සහ ඊට අදාළ කර්තව්‍ය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"තැනැත්තා" යන්නෙන්, යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු අදහස් වන අතර, ඊට ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් ද නෛතික පුද්ගලභාවයක් ඇති හෝ නොමැති නෛතික වැඩපිළිවෙලක් ද එම තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද ශාඛාවක් ද ඇතුළත් වේ;

"අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය" යන්නෙන්, 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ විධිවිධාන ප්‍රකාරව පිහිටුවන ලද අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය අදහස් වේ;

"දේපළ" යන්නෙන්, ද්‍රව්‍යමය හෝ අද්‍රව්‍යමය වුව ද, චංචල හෝ නිශ්චල වුව ද, ස්පර්ශනීය හෝ අස්පර්ශනීය වුව ද හෝ අතථ්‍ය වුව ද සෑම

වර්ගයක ම වත්කම් අදහස් වන අතර, ඊට එම වත්කම්වලට ඇති හිමිකම හෝ එම වත්කම් කෙරෙහි ඇති සම්බන්ධතාව පිළිබඳ සාක්ෂි වන්නා වූ නෛතික ලේඛන හෝ සාධනපත්‍ර ද ඇතුළත් වේ;

"විශේෂ කළමනාකරු" යන්නෙන්, 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ විධිවිධාන ප්‍රකාරව මහාධිකරණය විසින් පත්කරනු ලබන විශේෂ කළමනාකරුවකු අදහස් වේ;

"නිශ්චිත රට" සහ "නිශ්චිත සංවිධානය" යන්නට, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ත්‍රස්තවාදී ක්‍රියාව" යන්නට, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"දේපළ පිළිබඳ ගනුදෙනුව" යන්නට -

(අ) මිලදී ගැනීමක්, විකිණීමක්, ණයක්, අය කිරීමක්, උකසක්, කැප අයිතියක්, ඔඩපනයක්, පැවරීමක්, භාරදීමක්, භාරකිරීමක්, ප්‍රතිනිවේශනයක්, ප්‍රේෂණයක්, ත්‍යාගයක්, පරිත්‍යාගයක්, භාරයක් ඇති කිරීමක්, නිරවුල් කිරීමක්, යම් භාණ්ඩයක් තැන්පත් කිරීම ද ඇතුළුව තැන්පතුවක්, ආපසු ගැනීමක්, වත්කම් අතර පැවරීමක් සහ ණයවර දීර්ඝ කිරීමක් ද;

(ආ) යම් අනුයෝජිතත්වයක් හෝ ඇටෝර්නි බලය පැවරීමක් ද; සහ

(ඈ) ඒ සමස්ත දේපළ කෙරෙහි හෝ ඉන් යම් කොටසක් කෙරෙහි යම් වර්තමාන හෝ අනාගත වුව ද, පැවරුණු හෝ සම්භාවී වුව ද, යම් අයිතිවාසිකමක්, හිමිකමක්, සම්බන්ධතාවක් හෝ වරප්‍රසාදයක් යම් තැනැත්තකුට පිරිනැමීමේ ප්‍රතිඵලය ඇති කරන, කවර ආකාරයකින් වූ හෝ කවර විස්තරයකට නැතහොත් කවර ස්වභාවයකට අයත් වූ හෝ කවර ආකාරයකින් විස්තර කරනු ලබන්නා වූ වෙනත් යම් නීයාදනයක් හෝ ගනුදෙනු කිරීමක් ද,

ඇතුළත් වේ;

"නීතිවිරෝධී ක්‍රියාකාරකම" යන්නෙන් -

(අ) (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත හෝ 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත යටතේ;

(ආ) ත්‍රස්තවාදය වැළැක්වීම සහ මැඩපැවැත්වීම සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් හෝ නියෝගයක් යටතේ;

(ඇ) 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ;

(ඈ) (182 වන අධිකාරය වූ) තුවක්කු ආඥාපනත, (183 වන අධිකාරය වූ) පුපුරන ද්‍රව්‍ය ආඥාපනත හෝ 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනත යටතේ;

(ඉ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් යටතේ;

(ඊ) 1988 අංක 30 දරන බැංකු පනතේ 83ඇ වන වගන්තිය යටතේ;

(උ) අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ;

(ඌ) සයිබර් අපරාධ, බ්ලොක්චේන් තාක්ෂණය, අතථ්‍ය වත්කම් හෝ අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ;

(එ) ළමයින්ට එරෙහි වැරදි සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ;

(ඒ) තැනැත්තන් වෙළඳාම් කිරීම හා ජාවාරම් කිරීම සම්බන්ධයෙන් වන වැරදිවලට අදාළව තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ;

(ඔ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් යටතේ;

(ඕ) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් යටතේ;

(ක) 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් යටතේ;

(ග) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් සහ පරිසරය, සමුද්‍රීය පරිසරය සහ ස්වභාවික සම්පත් සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ;

(ච) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් යටතේ;

(ජ) 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ V වන කොටස යටතේ;

(ට) 2001 අංක 9 දරන මුහුදු කොල්ලකෑම් පනත සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් යටතේ;

(ඩ) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් යටතේ;

(ණ) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 367 වන, 373 වන, 386 වන, 389 වන, 390 වන, 400 වන, 401 වන, 402 වන සහ 403 වන වගන්ති යටතේ;

(ත) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 189 වන වගන්තිය යටතේ;

(ද) වක්‍ර බදු අයකිරීම, එකතු කිරීම සහ පැහැර හරින ලද බදු අයකර ගැනීම සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ;

(න) කූට ලේඛන සෑදීම සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ;

(ප) මුදල් නෝට්ටුවල හෝ කාසිවල ව්‍යාජ අනුකරණ සෑදීම සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ;

(බ) නිෂ්පාදනවල ව්‍යාජ අනුකරණ සෑදීම සහ නිෂ්පාදන අයිතිය කඩ කිරීම සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ;

(ම) සොරකම් කළ භාණ්ඩ හෝ වෙනත් භාණ්ඩ නීතිවිරෝධී ලෙස වෙළඳාම් කිරීම හෝ ජාවාරම් කිරීම සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ;

(ය) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 2 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ;

(යඅ) (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් යටතේ; හෝ

(යආ) මරණීය දණ්ඩනයෙන් හෝ අවුරුදු පහකට හෝ ඊට වැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි, තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ,

වරදක් සංස්ථාපනය වන යම් ක්‍රියාවක් අදහස් වන අතර, ඊට ශ්‍රී ලංකාවෙන් පිටත යම් අධිකරණ බල සීමාවක් තුළ සිදු කරන ලද, එම අධිකරණ බල සීමාව තුළ මුදල් විශුද්ධිකරණය වරදට අනුරූප වරදක් සංයුක්ත වන නැතහොත් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබුවේ නම් (අ) ඡේදයේ සිට (යආ) ඡේදය දක්වා වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ වූ වරදක් සංයුක්ත වන ක්‍රියාවක් ද ඇතුළත් වේ;

“අතථ්‍ය වත්කම” යන්නෙන්, ඩිජිටල් ආකාරයෙන් වෙළෙඳාම් කළ හැකි හෝ පවරනු ලැබිය හැකි වූ ද, ගෙවීම් හෝ ආයෝජන කාර්ය සඳහා භාවිත කළ හැකි වූ ද, වටිනාකම් පිළිබඳ ඩිජිටල් නිරූපණයක් අදහස් වන නමුත්, ඊට අධිකාරී මුදල්, සුරැකුම්පත් සහ වෙනත් මූල්‍ය වත්කම් පිළිබඳ යම් ඩිජිටල් නිරූපණයක් ඇතුළත් නොවේ; සහ

“අතථ්‍ය වත්කම් සේවා සපයන්නා” යන්නෙන්, වෙනත් තැනැත්තකු සඳහා හෝ වෙනත් තැනැත්තකු වෙනුවෙන් පහත දැක්වෙන ක්‍රියාකාරකම් හෝ මෙහෙයුම් එකක් හෝ වැඩි ගණනක් සපයන, පරිපාලනය කරන,

කළමනාකරණය කරන හෝ සිදු කරන යම් තැනැත්තකු අදහස් වේ:-

(අ) අතථ්‍ය වත්කම් සහ අධිකාරී මුදල් හුවමාරු කිරීම;

(ආ) අතථ්‍ය වත්කම් ස්වරූප එකක් හෝ වැඩි ගණනක් හුවමාරු කිරීම;

(ඇ) අතථ්‍ය වත්කම් පැවරීම;

(ඈ) අතථ්‍ය වත්කම් පාලනය කිරීමට හැකි කරවමින් අතථ්‍ය වත්කම් හෝ සාධනපත්‍ර සුරක්ෂිතව තබා ගැනීම හෝ පරිපාලනය කිරීම; සහ

(ඉ) අතථ්‍ය වත්කමක් නිකුත් කරන්නකුගේ අර්පණයකට හෝ විකිණීමකට අදාළ මූල්‍ය සේවාවලට සහභාගී වීම සහ එම සේවා සැපයීම.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**32.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.